# සංහිඳියාව උදෙසා ප්‍රවිචාරණ කාර්යසාධක බලකායේ අවසන් වාර්තාව

විධායක සාරාංශය හා නිර්දේශ

# நல்லிணக்கப் பொறிமுறைகள் பற்றிய கலந்தாலோசனைக்கான செயலணியின் இறுதி அறிக்கை

நிறைவேற்றுச் சுருக்கமும்
பரிந்துரைகளும்

# FINAL REPORT OF THE CONSULTATION TASK FORCE ON RECONCILIATION MECHANISMS

Executive Summary and Recommendations

සංහිඳියා යාන්ත්‍රණ උදෙසා ප්‍රව්චාරණ කාර්යසාධක බලකායෙහි අවසන් වාර්තාව 2016 නොවැම්බර් 17 වන දින අවසන් කරන ලදී. මෙම වාර්තාවෙහි විධායක සාරාංශය සහ නිර්දේශ සඳහා සිංහල සහ දෙමළ පරිවර්තනයන් මෙම පොතෙහි ඇතුළත්වේ.

සංහිඳියා යාන්ත්‍රණ උදෙසා ප්‍රව්චාරණ කාර්යසාධක බලකාය

~

நல்லிணக்கப் பொறிமுறைகள் பற்றிய கலந்தாலோசனைக்கான் செயலணியின் இறுதி அறிக்கையானது 17 நவம்பர் 2016 அன்று முற்றுப் பெற்றது. அறிக்கையின் நிறைவேற்றுச் சுருக்கம் பரிந்துரைகள் ஆகியவற்றின் தமிழ் சிங்கள மொழிபெயர்ப்புகள் இந் நூலில் அடங்கியுள்ளன.

நல்லிணக்கப் பொறிமுறைகள் பற்றிய கலந்தாலோசனைக்கான செயலணி

~

The final report of the Consultation Task Force on Reconciliation Mechanisms was completed on the 17th of November 2016. This book contains the Sinhala and Tamil translations of the Executive Summary and the Recommendations of the report.

Consultation Task Force on Reconciliation Mechanisms

# පටුන
# பொருளடக்கம்
# Table of Contents

විධායක සාරාංශය ....................................................................................................1
සංහිඳියාව උදෙසා වන ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිරීක්ෂණ සහ නිර්දේශ .................... 16
நிறைவேற்றுச் சுருக்கம் ....................................................................................................40
கலந்தாலோசனைச் செயலணி: அவதானிப்புகளும் பரிந்துரைகளும் ...................................... 57
Executive Summary ..................................................................................................... 83
CTF Observations and Recommendations .................................................................... 98

# විධායක සාරාංශය

**විධායක සාරාංශය**

**අ. කාර්යසාධක බලකාය හා ප්‍රවිචාරණයන් සඳහා ක්‍රමවේදය ස්ථාපිත කිරීම**


1. සංක්‍රාන්ති යුක්තිය හා සංහිඳියාව සඳහා යෝජිත යාන්ත්‍රණයන් පිළිබඳ ජනතාවගේ අදහස් හා විචාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව පිළිබඳ 2015 ඔක්තෝම්බර් පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිලිබඳ කවුන්සිලයේ තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා රජයේ සම අනුග්‍රහය ඇතිව අග්‍රාමාත්‍යවරයා විසින් 2016 ජනවාරි අගභාගයේ දී සිවිල් සමාජයෙන් තෝරා ගත් සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය පත් කෙරිණි. ප්‍රවිචාරණය මෙම යාන්ත්‍රණයන්ට සීමා නොවූ අතර සංහිඳියාව සඳහා ජනතාව යෝජනා කිරීමට අපේක්ෂා කරන අනෙකුත් යාන්ත්‍රණ හා ක්‍රියාවලීන් පිළිබඳ සාකච්ඡා ද ඊට ඇතුළත් විය.

2. ප්‍රවිචාරණයේ අවසාන වාර්තාව යෝජිත යාන්ත්‍රණ හතර සහ සංක්‍රාන්ති යුක්තිය හා සංහිඳියාවට සම්බන්ධ මනෝ සමාජීය සහය සහ රාජ්‍ය හා සාමාජීය ප්‍රතිසංස්කරණ ආදී සර්වව්‍යාපී ගැටළු පිළිබඳ එක් එක් කරුණට වෙන් වූ පරිච්ඡේද සහිතව සකස් වී ඇත. ප්‍රවිචාරණයන්ගේ සන්දර්භය හා අනාගතය කෙරෙහි සංහිඳියාවේ බලපෑම් ඇති වීමට පාදක විය හැකි චිරස්ථායී කරුණු දක්වන හැඳින්වීමක් ද අනෙකුත් පරිච්ඡේද අතර වේ. යාන්ත්‍රණ පිළිබඳ පරිච්ඡේද ප්‍රවිචාරණ ක්‍රියාවලියේ දී ජනතාව දක්වන ලද අදහස් මත පදනම් වී ඇති අතර ජනතාවගේ මෙන්ම එක් එක් යාන්ත්‍රණය - අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය, හානි පූර්ණය සඳහා වන කාර්යාලය, සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාව සහ විශේෂ අධිකරණයක් හා විශේෂ උපදේශකයකුගේ කාර්යාලයකින් සමන්විත අධිකරණ යාන්ත්‍රණයක් පිළිබඳ නිශ්චිත නිර්දේශ ද ඊට ඇතුළත් වේ. ප්‍රවිචාරණයන්වලදී මහජනතාව හා පාර්ශවකරුවන් විසින් දක්වන ලද අදහස් හා මතයන් මගින් දැන ගැනීමට ලැබුණු ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිර්දේශ සඳහා අවසාන පරිච්ඡේදය වෙන් කර ඇත.

3. නියෝජිතයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් හා විශේෂඥයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් මගින් ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායට සහාය ලබා දෙනු ලැබීය. විශේෂඥයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලය මගින් ප්‍රවිචාරණයේ දී සංක්‍රාන්ති යුක්තියේ මූලික හරය, එහි විශේෂ භාවිතාව සහ ශ්‍රී ලංකාවට එහි ඇති අදාළත්වය පිළිබඳව ද නියෝජිතයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලය මගින් කලාපීය කාර්ය සාධක බලකාය සඳහා සාමාජිකයන් තෝරා ගැනීම පිළිබඳව ද ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය වෙත උපදෙස් ලබා දෙන ලදී. කෙසේ වුවද ඔවුන්ගේ දායකත්වයෙහි කැපී පෙනෙන සමානාත්මතාවයක් විය. තම ප්‍රජාවේ හා ප්‍රදේශයේ පුද්ගලයන් වෙත තමන් කැමති භාෂාවකින් අදහස් දැක්වීම ජනතාවට වඩාත් පහසුවේය යන අදහස ඇතිව ප්‍රසිද්ධ රැස්වීම් හා ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම මගින් ප්‍රවිචාරණයන් මෙහෙයවීමේ කාර්යය උතුරු හා නැගෙනහිර පළාත්වල එක් දිස්ත්‍රික්කයකට එක බැගින් හා අනෙක් පළාත් හතට එක බැගින් වන කලාපීය කාර්ය සාධක බලකායන්ට පැවරිණි. ප්‍රවිචාරණයන් මත පදනම් වූ කලාපීය කාර්ය සාධක බලකායේ වාර්තා එක් වාර්තාවක් ලෙස සකස් කර ඇත. ඒවා ප්‍රධාන ගැටළු හා යෝජිත යාන්ත්‍රණයන්ට අනුව සම්පාදනය කිරීම හා භාණ්ඩගත කිරීම සඳහා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය වෙත යවන ලදී. කලාපීය කාර්ය සාධක බලකායේ සාමාජිකයින් සිවිල් සමාජයෙන් තෝරා ගන්නා ලද අතර ඔවුන් අතර හිටපු රාජ්‍ය සේවකයන් හා ඇතැම් අවස්ථාවන්හි දී පූජ්‍ය පක්ෂය ද විය. එක් එක් කලාප අනුව වාර්ගික හා ආංශික නියෝජනය හා භාෂා ප්‍රවීණතාවය තහවුරු කිරීමට අමතරව කලාපීය කාර්ය සාධක බලකාය තුළ කාන්තා නියෝජනය 50%ක් විය. කලාපීය කාර්ය සාධක බලකායේ නව්‍යතාවය, එහි අන්තර්ගතය හා ප්‍රවේශය ප්‍රජා මට්ටමින් බෙහෙවින් අගය කෙරුණු අතර එය දිවයින පුරා ප්‍රවිචාරණයන්ගේ සාර්ථකභාවය තහවුරු කිරීමට දායක වූ ප්‍රධාන සාධකයක් විය.

4. ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ ඉල්ලීම පරිදි මානව හිමිකම් කොමිෂන් සභාවේ නියෝජිතයකු ප්‍රවිචාරණයන්වලට සහභාගි වූ අතර ප්‍රවිචාරණයන් අතරතුර මානව හිමිකම් කොමිෂන් සභාවට මැදිහත් වී කටයුතු කළ හැකි පරිසරය සුළු කොට තකන ආකාරයේ සිදුවීම් සිදු වී නම් ඒ සම්බන්ධයෙන් පසු විපරම් කෙරෙන බව තහවුරු කිරීමට ඔවුන් මැදිහත් විය.

5. කලාපීය කාර්ය සාධක බලකායේ ප්‍රවිචාරණයන්ට අමතරව, ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය මගින් ජාතික මට්ටමින් හමුදාව, අතුරුදන් වූවන්ගේ පවුල්, ආගම් නියෝජනය කරන සාමාන්‍ය ජනතාව, වෘත්තීය හා මාධ්‍ය සංවිධාන, කාන්තා කණ්ඩායම්, නිර්මාණාත්මක කලාවන්ගේ නියැලෙන පුද්ගලයන් හා සංවිධාන ආදී ප්‍රධාන ක්ෂත්‍රවල නියෝජිතයන් සමග ප්‍රවිචාරණයන් පවත්වන ලදී. මේ සඳහා වෙන් කෙරුණු වෙබ් අඩවියක්, ඊ-මේල් හා තැපැල හරහා ද කරුණු ඉදිරිපත් කෙරිණි.




6. ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය වෙත අදහස් ඉදිරිපත් කිරීම් 7,306 ක් ලැබුණු අතර ඒ අතරින් 4,872ක් ප්‍රසිද්ධ රැස්වීම්වල දී ද 1386ක් ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා වලදී ද 1048ක් ලිඛිත අදහස් ඉදිරිපත් කිරීම් ලෙස ද ලැබිණි. අදහස් ඉදිරිපත් කිරීම් උපරිම මට්ටමින් සිදු වූයේ පිළිවෙලින් මඩකලපුව, අම්පාර හා දකුණු පළාතේ සිදු කරන ලද ප්‍රවිචාරණයන්වලදී වන අතර සෑම කලාපයකම 500 ඉක්මවූ සාමාන්‍යයක් දක්නට ලැබිණි. වයඹ හා බස්නාහිර පළාත්වල සිදු කරන ලද ප්‍රවිචාරණයන්වලදී අදහස් ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව 250ට අඩු අවම අගයක් විය. යාපනය හා උතුරු මැද පළාත්වල අගය ඇස්තමේන්තු මත පදනම් වූ අතර එය අනෙක් කලාපවල ලිඛිත වාර්තාවක් මත පදනම් විය.

**ආ. සර්වව්‍යාපී ගැටළු : නිරීක්ෂණ හා නිර්දේශ**

1. ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය මගින් ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්තිය හා රජය විසින් යෝජිත යාන්ත්‍රණයන් සඳහා තාර්කිකය කෙරෙහි රජයේ ඉහළම මට්ටම්වල සහාය හා පාක්ෂපාතීභාවය අපේක්ෂා කෙරිණි. කෙසේවුවද මෙය ඉටු නොවූ අතර ප්‍රජා මට්ටමින් සිදු කෙරුණු කලාපීය කාර්ය සාධක බලකායේ ප්‍රවිචාරණයන්වලදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ තම ආදරණීයයන් සෙවීමේ දී සහ පසුගිය කාලයේ පරීක්ෂණ හා විමර්ශන පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා කිහිපයක් ඉදිරියේ පෙනී සිටීම හා කරුණු ඉදිරිපත් කිරීම ඇතුළුව දුක්ගැනවිලි සඳහා පිළියම්

සෙවීමේ දී ජනතාවගේ විස්තර හා අත්දැකීම් කෙරෙහිය. එසේ වුවත් ප්‍රධාන යාන්ත්‍රණයන් හතරට අදාළව ප්‍රවිචාරණයන්ගේ විෂය පථය කේන්ද්‍රගත කිරීමට සහ සංක්‍රාන්ති යුක්තියට සම්බන්ධ වෙනත් යෝජනාවලට යම් බලපෑමක් එල්ල කිරීමට කලාපීය කාර්ය සාධක බලකාය හා මාධ්‍ය මගින් සිදු කරන ලද දැනුවත් කිරීම හේතු පාදක විය. එබැවින් යාන්ත්‍රණයන් හතරෙහි නිර්මාණය, පත්කිරීමේ ක්‍රියාවලිය, බලය හා ක්‍රියාකාරකම්වලට අදාළ තාක්ෂණික කරුණු පිළිබඳ සෘජුව ඉදිරිපත් වූ අදහස් සීමා සහිත වුවද කරුණු විමසීමේ දී ජනතාවගේ දැඩි උනන්දුවක් හා ඉහළ සහභාගීත්වයක් ඇති කෙරුණු අතර ප්‍රධාන ගැටළු පිළිබඳ අදහස් ද ලබා ගන්නා ලදී. සමස්ථ ක්‍රියාවලිය තුළ ජනතාවගේ සහභාගීත්වය හා හිමිකාරීත්වය තහවුරු කිරීමේ පළමු පියවර සනිටුහන් කරමින් අදහස් විමසූ අවස්ථාවේ දී ඇතැම් පුද්ගලයෝ විමතිය පල කළහ. ඉහත කරුණු සලකා බලා සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ රජය විසින් ජනතාව සමග ඉහළ මට්ටමින් අඛණ්ඩව සන්නිවේදනය සිදු කළයුතු බවට ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය මගින් නිර්දේශ කරන ලදී.

2. පසුගිය ප්‍රයත්නයන්ගේ අසම්පූර්ණ ස්වභාවය හා පිළියම් ලබා දීමට නොහැකි වූ අසාර්ථකභාවය නොසලකා තවත් ප්‍රයත්නයක් වන මෙම අවස්ථාවේ දී රට පුරා ජනතාව විසින් සැලකිය යුතු මට්ටමේ අපේක්ෂා භංගත්වයක්, දොම්නසක් හා කෝපයක් පල කෙරිණි. මේ සමග මෙම සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන් පිළිබඳ වූ ප්‍රවිචාරණයන් සිදුකිරීම වෙනස් ස්වරූපයක් ගනු ඇතැයි යන අපේක්ෂාව හා ප්‍රාර්ථනාව ද විය. ජනතාවගේ අදහස්වල මෙම ද්විත්ව ස්වරූපය ප්‍රවිචාරණයන්වලදී දැඩි ලෙස ඉස්මතු වූ අතර ප්‍රතිපත්ති සම්පාදනය හා සංක්‍රාන්ති යුක්තිය සහ සංහිඳියාව සඳහා වන යාන්ත්‍රණයන් නිර්මාණයේ දී මේ පිළිබඳ දැන්විය යුතුය. සත්‍යයේ අවශ්‍යතාවය, නියෝග ලබා දුන් පුද්ගලයන්ගේ වගවීම හා නැවත සිදු වීමට එරෙහි හැඟීමෙහි දැඩි බව අනුව සත්‍යය, යුක්තිය හා වගවීම, හානි පූර්ණයන් හා නැවත සිදු නොවීම තහවුරු කිරීම ආදියට අදාළව නිර්වචනය කරන ලද සංක්‍රාන්ති යුක්තියට ඇති හිමිකම කෙරෙහි වූ ව්‍යවස්ථාමය පිළිගැනීම හා එය තහවුරු කිරීම ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය මගින් නිර්දේශ කෙරේ.

3. ආරක්ෂක අංශ හා පොලිස් නිලධාරීන්ගේ මෙම සංහිඳියා ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ප්‍රතිඵලවලට විරුද්ධ ප්‍රතිඵලයක් ලබා දෙනු ඇතැයි ද ජාතික ආරක්ෂාව පිළිබඳ එකඟතාවයකට එළඹීම, පවතින සිත් වේදනාවන් තීව්‍ර කරනු ඇති බවටත් අළුතින් සිත් වේදනාවන් ඇති කරනු ඇති බවටත් අන්තර් වාර්ගික හා ආගමික බෙදීම් වැඩි කරනු ඇති බවටත් වන අනතුරු හැඟවීම් සහිත අදහස් ඉදිරිපත් කිරීම් තිබූ බව සඳහන් කළ යුතුය. ආරක්ෂක අංශවල සියළු ම නිලධාරීහු විශේෂයෙන් වගවීම් යාන්ත්‍රනෙයට අන්තර්ජාතික මැදිහත්වීම තදින් ම ප්‍රතික්ෂප කළහ. කෙසේවතුදු ආරක්ෂක අංශ නිලධාරීන් හා පොලිස් නිලධාරීන් විසින් කරනලද අදහස් ඉදිරිපත් කිරීම් බොහෝමයක් මගින් සංහිඳියාව සඳහා රජය විසින් ගෙන ඇති ප්‍රයත්නයන්ට හා විපාකදායී නොවන පිළියම් ලබා දීම සඳහා වන ප්‍රවේශය සඳහා පැහැදිලි ලෙස සහාය දක්වා ඇති අතර ඒ සඳහා ආගමික නායකයන්ගේ මැදිහත් වීම ද අවශ්‍ය බව පෙන්වා දී ඇත. නැවත සිදු නොවීම සඳහා වන ව්‍යවස්ථා සංශෝධන හා සැකයන් හා වැරදි තොරතුරු සන්නිවේදනය වැළැක්වීමට සෑම මට්ටමකම පුද්ගලයන් සමග රජය තොරතුරු හුවමාරු කර ගැනීම තහවුරු කිරීම සඳහා සංහිඳියාව හා හානි පූර්ණය කෙරෙහි ප්‍රමුඛතාව ලබදිය යුතු බව ඔවුහු ප්‍රකාශ කළහ.

4. තමන් රජයේ දේශපාලන මග පෙන්වීම හා සහාය මත එහි අරමුණු ළඟා කර ගත්ත ද වර්තමානය වන විට තමන් අතර සාමූහිකත්වය හා සහයෝගය මඳ බවක් හැඟෙන බව ද හමුදා නියෝජිතයන් විසින් ප්‍රකාශ කරන ලදී. එමෙන් ම සත්‍යය සෙවීමේ ක්‍රියාවලියක් සඳහා මෙන් ම යම් ආකාරයක සාපරාධී ක්‍රියාවන් පිළිබඳ සාක්ෂි සොයා ගතහොත් වැරදිකරුවන්හට චෝදනා ගොනු කිරීම සඳහා ද තම සහාය ලබා දෙන බව ද ඔවුහු ප්‍රකාශ කළහ. ඔවුන්ගේ දැනීමට අනුව කිසිඳු සාපරාධී ක්‍රියාවක් සිදු වී නැති බැවින් පොදු සමාවක අවශ්‍යතාවක් තමන් නොදකින බවද ඔවුහු කියා සිටියහ. ඔවුහු සිවිල් ජනතාව හිතාමතා ඉලක්ක නොකෙරුණු බවත් සිවිල් පුද්ගල මරණ වැළැක්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවත් තදින් කියා සිටි අතර වෙඩි ප්‍රහාරයන්ට මැදි වූ සිවිල් වැසියන් මිය යන්නට ඇති බව පිළිගත්හ.එමෙන් ම ඔවුහු ලිංගික හිංසනය

යුද අවියක ලෙස භාවිතා කළ බව ද ප්‍රතික්ෂේප කළහ. කිසිදු සාපරාධී ක්‍රියාවක් ඇති නොවූ බවත් නීති විරෝධී අවි භාවිතා නොකළ බවත් ගුවන් හමුදාව අවධාරණය කළේය.

5. සංක්‍රාන්ති යුක්තිය හා සංහිඳියාව කෙරෙහි රජයේ කැපවීම පිළිබඳ විශ්වාසය හා පැහැදීමේ මද බව සහ සංහිඳියාව සඳහා වන ක්‍රියාවලිය පිළිබඳ සැක පහළ කිරීම හේතුවෙන් ඉහත ඒවාට අමතරව විවිධත්වය ශක්තියේ පදනම හා වත්කමක් ලෙස පිළිගත් සියළු ජනතාව අතර වන අන්‍යෝන්‍ය ගෞරවය මත පුරවැසිභාවය ස්ථාපිත කෙරුණු රජයේ හා සිවිල් සමාජයේ ඉහළ ම මට්ටම් විසින් ප්‍රචලිත කෙරුණු බහු විධ, බහු වාර්ගික හා බහු ආගමික ශ්‍රී ලංකාවක් සඳහා වන දැක්මක අවශ්‍යතාව ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් දැඩි ලෙස අවධාරණය කෙරේ. විවිධත්වය තුළ වන සාමූහිකභාවය, සියළු ශ්‍රී ලාංකිකයන්ගේ බහුවිධ අනන්‍යතාවයන් කෙරෙහි ගරු කිරීම හා ඒවා ආරක්ෂා කිරීම ආදිය රට තුළ අර්ථාන්විත සංහිඳියාව, සාමය හා සෞභාග්‍යමය ඇති කිරීම සඳහා මූලික අවශ්‍යතාවන් වේ.

6. ඒ අනුව වාර්ගික බෙදීම හා අන්‍ය ආගම් නොඉවසීම වැළැක්වීමට සහ ඕනෑම ආකාරයකට අර්ථ දැක්වෙන ප්‍රජාවකට අදාළව බියකින් හෝ පක්ෂපාතීභාවයකින් තොරව නීතියේ නිසි ක්‍රියාකාරීත්වය යටතේ වගකිව යුතු පුද්ගලයන් වගවීමට ලක් කිරීම සඳහා රජය විසින් ඵලදායී, ඉතා පැහැදිලි ක්‍රියා මාර්ග ගත යුතුය. තවද රට තුළ සියළු ආගම්වලට සම ගෞරවයක් හිමිවන අනාගාමික ලෞකික රාජ්‍යයක් ස්ථාපිත කළ යුතු බව ඇතැම් අදහස් ඉදිරිපත් කිරීම් මගින් ඉස්මතු විය' ඔවුහු මෙය සම පුරවැසිභාවයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙසත් සංහිඳියාවේ ඇරඹුම් ලක්ෂය ලෙසත් පෙන්වා දුන්හ. සියළු පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමෙන් පසු ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කළ යුතු බවට නිර්දේශ කෙරේ.

7. ආරම්භයේ සිටම ආරක්ෂාව පිළිබඳ කරුණු ප්‍රවිචාරණයන්වලදී ප්‍රමුඛස්ථානයක් ගැණිනි. ප්‍රවීක්ෂණයේදී පෙර පැවති කොමිෂන් සභාවල කරුණු විමසීම් සිදු කිරීමේ දී ආරක්ෂක අංශ, බුද්ධි අංශ හා පොලිස් නිලධාරීන් තැති ගැන්වෙන ආකාරයෙන් සිටීම හා ප්‍රශ්න කිරීම පිළිබඳ සලකා බලා ප්‍රවිචාරණයන් සිදු කෙරෙන කාල සීමාව තුළ හා ඊට පසුව ද හැකියාවැති පරිසරයක් පැවතීම තහවුරු කිරීම සඳහා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් ආරක්ෂක අමාත්‍යංශය, ත්‍රිවිධහමුදා අණ දෙන නිලධාරීන් සහ පොලිසිය සමග සාකච්ඡා කරන ලදී. පොලිසිය හා හමුදාවට සම්බන්ධ නිලධාරීන් හඳුනා ගැණුනු අතර අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම හා වධ හිංසා පැමිණවීම පිළිබඳ අවධාරණය කෙරිණි. මෙම ක්‍රියා මාර්ගයන්ට අමතරව සිදු වීම් ගණනාවක් ද විය. ප්‍රවිචාරණයන්ට බාධා කරන ආරක්ෂක අංශ/ පොලිස් නිලධාරීන්ගෙන් ඉවත් වන ලෙස ඉල්ලීම සඳහා ඇතැම් අවස්ථාවලදී කලාපීය කාර්ය සාධක බලකායේ රැස්වීම්වලට පෞද්ගලිකව මැදිහත් වීමට ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ සාමාජිකයන්ට සිදු විය. ආරක්ෂක අංශ හා පොලිසියේ ඉහළම මට්ටම් සමග නිලධාරීන්ගේ මෙවැනි ක්‍රියාවන් වැලැක්වීමට එකඟ වී ගන්නා ලද ක්‍රියා මාර්ග තිබිය දී පවා මෙම සිදුවීම් ඇති වීමෙන් බිම් මට්ටමේ දී දඬුවම් නොලබා රැඳී සිටීමේ හැකියාව තහවුරු විය.

8. දඬුවම් නොලබා රැඳී සිටීමේ හැකියාව සංහිඳියාව කෙරෙහි වන ප්‍රධාන බාධකයක් ලෙසත් ඒ අනුව අර්ථාන්විත සංහිඳියාවක් ඇති කිරීම සඳහා රජයට ඇති කැමැත්ත හා හැකියාව පිළිබඳ සැලකීමේ දී යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීමට පෙර විශ්වාසය ගොඩනැගීමේ ප්‍රධාන ක්‍රියා මාර්ගයක් ලෙස එම තත්ත්වය වැළැක්වීම ද එමගින් විශ්වාසනීයභාවය ඇති කිරීම ද අදහස් ඉදිරිපත් කිරීම්වලදී හඳුනා ගැණිනි. සාක්ෂිවල විශ්වසනීයභාවය හා වින්දිතයාගේ ආරක්ෂාව පිළිබඳ ගැටළුව දඬුවම් නොලබා සිටීමේ හැකියාව, මහජන ආරක්ෂාවට ඉතා සමීප සම්බන්ධතාවක් ඇති අතර ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිර්දේශ මගින් දැඩි හා ස්වාධීන ආරක්ෂාව සඳහා දේශීය හා අන්තර්ජාතික සහාය ලබා ගැනීම පිළිබඳ අවධාරණය කර ඇත.

9. නිශ්චිත වශයෙන් හමුදාමය ගැටළු හා ආරක්ෂාව පිළිබඳ ගැටළු සම්බන්ධව කටයුතු කිරීම සඳහා විශ්වාසය ගොඩනැගීමේ වෙනත් ක්‍රියා මාර්ග රැසක් හඳුනා ගැණිනි. ඒවා ප්‍රවිචාරණ කාර්ය සාධක

බලකායේ නිර්දේශවල ඇතුළත් වේ. මෙම ක්‍රියා මාර්ග සිවිල් ජනතාවගේ කටයුතු, විශේෂයෙන් ආර්ථිකය හා සිවිල් පරිපාලනය කෙරෙහි හමුදාමය මැදිහත්වීම නැවැත්වීම, ආරක්ෂක අංශ විසින් අත්පත් කර ගන්නා ලද සිවිල් ජනතාවගේ ඉඩම් යළි ඔවුන් වෙත භාර දීම ඉක්මන් කිරීම, සේනා විමුදනය හා හමුදාවන් ඉවත් කිරීම ආදියට සම්බන්ධවේ. එමෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හෝ වෙනත් නීතියක් යටතේ වැරදිකරුවන් නොකරන ලද රැඳවියන් හා හමුදාව වෙත භාර වූවන් නිදහස් කරන ලෙසත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරන ලෙසත් රැඳවියන්ගේ නම් හා ඔවුන් රඳවා සිටින ස්ථාන ඇතුළත් ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කරන ලෙසත් දැඩිව ඉල්ලා සිටිනු ලැබේ.

10. ප්‍රවිචාරණයන්වල දී අවධාරණය කෙරුණු විශ්වාසය ගොඩ නැගීමේ ප්‍රධාන ක්‍රියා මාර්ගයක් වනුයේ දේශපාලනික හා ව්‍යවස්ථාමය වශයෙන් ගැටුම සමථයකට පත් කර ගැනීමේ ප්‍රධාන අවශ්‍යතාවයයි. මෙය සංහිඳියාව හා එක්සත් රටක් සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස අදහස් ඉදිරිපත් කිරීම්වලදී අවධාරණය කෙරිණි. ඒ අනුව මෙය ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිර්දේශවල සඳහන් කර ඇත.

11. යුද්ධ අපරාධ හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ මෙන්ම සියළු පුද්ගලයන් බලෙන් අතුරුදහන් කිරීමෙන් ආරක්ෂා වීම සඳහා වන අන්තර්ජාතික සම්මුතියෙහි අපරාධය අර්ථ දක්වා ඇති ආකාරයට අතුරුදහන් කිරීමේ අපරාධය අපරාධයක් ලෙස හඳුනා ගැනීම සහ ශ්‍රී ලංකාව තුළ නීතිගත කිරීම ද විශ්වාසය ගොඩනැගීමේ ප්‍රධාන ක්‍රියා මාර්ග ලෙස අවධාරණය කෙරිණි. ඒවා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිර්දේශවල ඇතුළත් වේ.

12. ප්‍රවිචාරණ ක්‍රියාවලිය තුළින් ඉස්මතු වන තවත් සර්වව්‍යාපී කරුණක් වන්නේ සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන්ගේ නිර්මාණය හා මෙහෙයවීම සඳහා මනෝසාමාජීය ප්‍රතිෂ්ඨාවන්ගේ අවශ්‍යතාවය සහ සියළු වාර්ගික කණ්ඩායම්වලට අයත් බලපෑමට ලක්වූවන් (සිවිල් ජනතාව හෝ හමුදා භටයින්) සඳහා පිළියම් ලබාදීමේ මනෝසාමාජීය සහායයි. බලපෑමට ලක් වූවන්ගේ අවශ්‍යතාවන්ගේ වැදගත්කම, සංක්‍රාන්ති යුක්තියෙහි අවශ්‍යතාවන්ට සමගාමීව සහ ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශයෙහි මනෝසාමාජීය කාර්ය සාධක බලකාය සමග සහයෝගයෙන් පවතින සේවාවන් ශක්තිමත් කිරීම හා පවත්වාගෙන යාම ආදී කරුණු ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිර්දේශ මගින් අවධාරණය කරයි

13. මෙම වාර්තාවෙහි තරුණයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා පරිච්ඡේද වෙන්කර නොමැති අතර සියළු යාන්ත්‍රණයන් හා ඕනෑම ප්‍රතිසංස්කරණයක් සහ සංහිඳියා වැඩසටහනක් කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් එල්ල කරන සර්වව්‍යාපී ගැටළු ලෙස ඒවා මෙම වාර්තාව මගින් අවධාරණය කර ඇත. යාන්ත්‍රණයන් සඳහා සමබර වූ ස්ත්‍රී පුරුෂ හා තරුණ නියෝජනය, විශේෂයෙන් තීරණගන්නන්, චෝදකයන් සහ විනිශ්චයකරුවන් ලෙස මෙහෙයුම් ක්‍රියාවලියේ සෑම මට්ටමක් සඳහාම කාන්තාවන් පත්කිරීමෙහි ඇති වැදගත්කම ප්‍රවිචාරණයන් පුරාවට අදහස් ලබාදුන් පුද්ගලයන් විසින් අවධාරණය කරන ලදී.යාන්ත්‍රණයන්ට පහසුවෙන් ළඟා වීමේ හැකියාව හා අවකාශය ලබාදීම, රහස්‍යභාවයේ තහවුරුවන්, යාන්ත්‍රණය සමග කටයුතු කරන ලිංගික හිංසනයට හා අපයෝජනයට ලක්වූවන්ගේ හා මිව්වරුන්ගේ අවශ්‍යතාවන් කෙරෙහි සංවේදීවීම හා ගරුකිරීම ඇතුළුව යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වයට ස්ත්‍රී පුරුෂ අවශ්‍යතාවන් ඇතුළත්කිරීම පිළිබඳ ඔවුහු අවධාරණය කළහ. ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් මෙම කරුණු අනුමත කරන අතර බොහෝ කාලයක් තිස්සේ පවතින කාන්තාවන් සඳහා වන ජාතික කොමිෂන් සභාවක් සඳහා වන ඉල්ලීමට සහාය දක්වයි.

14. අදහස් ඉදිරිපත් කිරීම් රැසකදී හමුදාවන් හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි වෙනත් රාජ්‍ය ආයතන විසින් ඉඩම් අත්පත් කර ගැනීම, වෙනත් වාර්ගික ප්‍රජාවන්ගේ සාමාජිකයින් විසින් ඉඩම්වල දෙවන වර පදිංචිය හා ධීවර කටයුතුවල නියැලීම ආදී සිදුවීම් ඇතුළුව සංහිඳියාවට බලපෑ තවත් සර්ව ව්‍යාපී ගැටළුවක් ලෙස ඉඩම් පිළිබඳ ගැටළුව අදහස් ඉදිරිපත් කිරීම් රැසක දී ඉස්මතු

විය. සංකීර්ණ වූ අන්තර් වාර්ගික ඉඩම් ආරවුල් සඳහා ප්‍රමාදයකින් තොරව විසඳුම් ලබා දිය හැකි යාන්ත්‍රණයක් යාන්ත්‍රණයන් ඇතුළුව නිශ්චිත වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් මේ සඳහා අවශ්‍ය වේ. ඉඩම් සඳහා වන ජාතික කොමිෂන් සභාව සඳහා දැනට පවතින ව්‍යවස්ථාමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් නිර්දේශ කෙරේ.

15. ප්‍රවිචාරණයන්වල දී අවධාරණය කෙරුණු ඉහළ රාජ්‍ය අනුග්‍රහයේ අඛණ්ඩ අවශ්‍යතාවය හා සංක්‍රාන්ති යුක්තියෙහි සාර්ථකත්වය මෙන් ම සංක්‍රාන්ති යුක්තියේ සහ සංහිඳියාව පිළිබඳ ප්‍රතිපත්තියෙහි පැහැදිලි බව සඳහා ප්‍රවිචාරණ කාර්ය සාධක බලකායේ නිර්දේශවල ප්‍රමුඛතාවය ලබා දී ඇත. එබැවින් සංහිඳියාව සඳහා සැලැස්මක් සහ අපේක්ෂිත යාන්ත්‍රණයන්, එකිනෙක සමග මෙන්ම රාජ්‍ය අමාත්‍යාංශ ඇතුළු සංහිඳියාවට අදාළ කටයුතු පවරන ලද ආයතන සමග වන සම්බන්ධතාවන් සඳහා ප්‍රතිපත්තියක් හා මෙහෙයුම් රාමු රජය විසින් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවය විශේෂයෙන් ඉස්මතු කෙරේ.

16. ස්ථානය, භාවිත භාෂාව හා සංයුතියට අදාළව යාන්ත්‍රණයන්ට ළඟා වීමේ හැකියාව තහවුරු කිරීම මෙන්ම ආබාධිත හා කොන් කෙරුණු පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන්ගේ වැදගත්කම ප්‍රවිචාරණයන්වල දී අවධාරණය කෙරිණි. සියළුම යෝජිත යාන්ත්‍රණයන්ගේ සියළු මට්ටම්වලදී බලපෑමට ලක් වූවන් හැකි සෑම විටම නියෝජනය කිරීම හා සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන් හා නොඳුටු බවට වන සහතිකය වැනි මෙවලම් සඳහා සුදුසු සහ නොමග යවන සුළු නොවන භාෂාවක් භාවිතා කිරීම පිළිබඳ ජනතාව විසින් දිගින් දිගටම අවධාරණය කෙරිණි. ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් මෙම ඉල්ලීම් අවධාරණය කරන අතරම මීට අමතරව, බලපෑමට ලක් වූ පවුල්වල නියෝජිතයන්, මානව හිමිකම් සුරකින්නන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් හා ව්‍යවස්ථාදායක සභාව විසින් ඉදිරිපත් කරන ලද නම් ලැයිස්තුවකින් ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ජාත්‍යන්තර නියෝජිතයින්ගෙන් සමන්විත සමස්ථ යාන්ත්‍රණය සඳහා මෙහෙයුම් ඒකකයක් නිර්දේශ කරනු ලැබේ. මෙම මෙහෙයුම් ඒකකය විසින් ජනාධිපතිතුමා වෙත වාර්තා කළ යුතු අතර එම වාර්තා ප්‍රසිද්ධ කළ යුතුය.

**ඇ. යාන්ත්‍රණයන් පිළිබඳ වූ නිර්දේශ**

1. ප්‍රවිචාරණයන් සිදු කෙරෙන අතරතුර රජය විසින් අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලයක් සම්බන්ධ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර සභාවේ සැලකිය යුතු බාධාවන් මධ්‍ය යේ වුව ද අවසානයේ එය පාර්ලිමේන්තුවේ සම්මත විය. මේ සම්බන්ධයෙන් රජය විවේචනයට ලක් වීම විශ්මයට කරුණක් නොවන අතර ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය හා එහි ප්‍රවිචාරණයන් පිළිබඳ රජයේ අදහස පිළිබඳ සැක මතු කෙරිණි. ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය විසින් අතුරුදන් වූවන් පිළිබඳ වන කාර්යාලය සම්බන්ධව අතුරු වාර්තාවක් නිකුත් කළ අතර එය මෙම අවසාන වාර්තාවට අමුණා ඇත.

2. කෙසේ වුවද පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට පෙර හා එය සම්මත කර ගැනීමේ කාල සීමාව තුළ අතුරුදන් වූවන් හා අතුරුදන් වූවන් පිළිබඳ වන කාර්යාලය හා සම්බන්ධ ගැටළුව පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම් ගණනාවක් සිදුවිය. ප්‍රසිද්ධ රැස්වීම් කිහිපයක දී අදහස් ඉදිරිපත් කිරීම් විශාල ප්‍රමාණයක් දක්නට ලැබුණු අතර ඒ විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලදීය. මීට හේතුන් ලෙස දශක දෙකකට අධික කාලයක් තිස්සේ මෙම ගැටළුවට ලැබී තිබුණු වැදගත්කම, තම ආදරණීයයන් සොයා ගැනීමට යමක් කළ හැකිය යන විශ්වාසය හා කළ යුතු බවට පවුල්වල සාමාජිකයන් තුළ වන දැඩි අවශ්‍යතාවය, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සඳහා වන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පොදු කතිකාවන්, අතුරුදහන්වීම් සිදු වූ ආකාරයන් හා ගැටළුවට මැදි වූ පවුල් සංවිධානය වීම ආදිය දැක්විය හැකිය. මීට අදාළ ප්‍රධාන ඉල්ලීම් සිදු කෙරුණේ කාර්යාල නාමය තුළින් අතුරුදහන් වීම්වල අනිච්ඡානුක ස්වභාවය ඉස්මතු වීම, පැමිණිලි පාර්ශවයේ බලධාරීන් සමග තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයෙහි අභිමතය සීමා කිරීම, කාර්යාල වෙත ළඟා වීමේ හැකියාව, භාෂාව, නියෝජනය, අතුරුදහන් වූවන්

පිළිබඳ කාර්යාලයේ කටයුතුවලට අතුරුදහන් වූවන්ගේ පවුල්වල මැදිහත් වීම සහ බලපෑමට ලක් වූවන්ගේ ආරක්ෂාව ආදී කරුණු සම්බන්ධවයි. අතුරුදහන් වූ අතැම් පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන් විසින් යුක්තිය හා හානි පූර්ණය පිළිබඳ සාකච්ඡාවන් අපරිණත හා භයානක කටයුත්තක් ලෙස සලකනු ලැබීය. ඔවුන්ගේ අදහස අනුව ඉතා ඉක්මනින් ම කළ යුතු වූයේ යුද්ධයේ දී හා දකුණේ කැරැල්ලේ දී අතුරුදහන් වූවන් තවමත් ශ්‍රී ලංකාව හෝ විදේශ රටක් තුළ රඳවාගෙන සිටින්නේ ද යන්න නිශ්චය කොට දැන ගැනීමයි.

3. හානි පූර්ණය කිරීමේ ආකාර ගණනාවක් හඳුනා ගත්ත ද එසේ සිදු කරන ලද්දේ වාර්ගික හා ආගමික වශයෙන් ප්‍රජාවන් අත්දුටු හානිය හා පීඩාව දැඩිව පිළිගනිමින්ය. වන්දි ලබා දීම සඳහා වූ සියළු ඉල්ලීම් තුළ යුක්තිය, එනම් පිළියම් ලබා දීම හා හානි පූර්ණය තුළින් පුද්ගලයන් හෝ ප්‍රජාවන්ට එරෙහිව සිදු කරන ලද වැරදි නිවැරදි කළ යුතුය යන හැඟීම, සඳහා ද හඬක් විය.ඒ අනුව හානි පූර්ණයේ අවශ්‍යතාව ඉස්මතු වී ඇත්තේ රජය විසින් පුරවැසියන්ට සිදු කරන ලද වැරදිවලට වගවීම හා/ හෝ ඔවුන්ගේ පීඩාවන් පිළිගැනීම සඳහාය. තවද යුක්තිය හානි පූර්ණය කිරීමේ ක්‍රමයක් ලෙස පැහැදිලිව දක්වා ඇති අතර ඇතැම් අවස්ථාවල ඉල්ලා සිටින ලද එකම හානි පූර්ණය කිරීමේ ක්‍රමය ද එය විය. විශේෂයෙන් 1980 කාලයේ යුද්ධය හෝ දකුණේ කැරැල්ල හේතුවෙන් තම ආදරණීයයන් මිය ගිය හා අතුරුදහන් වී ඇති හා තම පවුලේ සාමාජිකයකු අහිමි වීම නිසා ඇති වන විවිධ ආකාරයේ බලපෑම්වලින් පීඩා විඳිමින් සිටින පුද්ගලයන් අතර ඔවුන්ගේ පීඩාව තුරන් කිරීමට රජයෙන් අපේක්ෂා කළ හැකි එකම දෙය, යම් ආකාරයක වන්දි ලබා ගැනීම පමණක් බවට හැඟීමක් විය. යුක්තිය පසිඳලීම ප්‍රමාණවත් හා අවශ්‍ය හානි පූර්ණය බවට වන යෝජනාව රට පුරා අදහස් ඉදිරිපත් කිරීම්වලින් ඉස්මතු විය.

4. පීඩනය යුද්ධයට සම්බන්ධ හිංසාවන් හා වාර්ගිකත්වයට අදාළව පමණක් ඇති නොවූ අතර උඩරට දමිළ ජනතාව හා දේශීය ප්‍රජාවන් ඇතුළුව පංතිය මත පදනම්ව ඇතැම් ප්‍රජාවන් අත්දුටු ආයතනගත ප්‍රචණ්ඩත්වය හා කොන් කිරීම මගින් ද ජනතාව පීඩාවට පත්විය. බලහත්කාරයෙන් ඉඩම් අල්ලා ගැනීම හා බලෙන් වෙනත් ස්ථානවල පදිංචි කරවීම මගින් මිනිසුන්ගේ සමාජ-ආර්ථික හිමිකම් උල්ලංඝණය කිරීම ද දිවයින පුරා යළි යළිත් කතාබහට ලක් වූ තේමාවකි. සංවර්ධන ව්‍යාපෘති සඳහා තම ඉඩම් අත්පත් කර ගත් නාගරික ප්‍රජාවන් හා පොදු ජනතාවගේ හිමිකම් හානියට ලක් කිරීම පිළිබඳ ගැටළුව ඉස්මතු කළ දේශීය ප්‍රජාවන් මෙයට ඇතුළත් විය.

5. සමස්ථයක් ලෙස රටේ සංවර්ධනය හේතුවෙන් තමන් රැකියා විරහිත තත්ත්වයට පත් වී ඇතැයි ද මූලික වශයෙන් හානි පූර්ණය සිදු කෙරෙන්නේ වන්දියක් ලබා දීම මගින් වන බැවින් එමගින් යුක්තිය පසිඳලීම හා වගවීමේ ක්‍රියාවලීන්ට බාධා ඇති වේය යන හැඟීම හෝ විකල්පයක් ලෙස සැලකෙනු ඇතැයි යන හැඟීම නිසා හානි පූර්ණය පිළිබඳ ජනතාව තුළ ඇති අකමැත්ත හා බිය ද අදහස් ඉදිරිපත් කිරීම්වලදී දැන ගැනීමට හැකි විය. මෙම අදහස විශාල වශයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශය, විශේෂයෙන් අතුරුදහන් වූවන්ගේ පවුල් වෙතින් ඉදිරිපත් විය.

6. ඉතා සුළු අදහස් ඉදිරිපත් කිරීම් සංඛ්‍යාවක් මගින් පමණක් හානි පූර්ණය සඳහා වන කාර්යාලයක අවශ්‍යතාව දක්වා ඇත. හානි පූර්ණය සඳහා වන ඉල්ලීම් පුද්ගලික හෝ සාමූහික ලෙස වර්ග කළ හැකි අතර එය ද්‍රව්‍යමය හා මූල්‍යමය හානි පූර්ණයේ සිට සංකේතාත්මක හානි පූර්ණය දක්වා වන පරාසයක් තුළ සිදු කළ හැකිය. හානි පූර්ණය කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශයන් ද අදහස් ඉදිරිපත් කිරීම්වල දී හඳුනා ගැණිනි. හානි පූර්ණය කිරීම පිළිබඳ වූ පැහැදිලි හා විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපත්තියක්, ඍජුව ම බලපෑමට ලක් වූවන් කේන්ද්‍ර කර ගත් හානි පූර්ණය සඳහා වන ප්‍රවේශයක් සහ වැඩසටහන් සම්පාදනයේ දී බලපෑමට ලක් වූවන්ගේ සහභාගීත්වය සහිතව අපක්ෂපාතී ආකාරයට හානි පූර්ණය කිරීම ආදී අදහස් මෙයට ඇතුළත් විය.

7. විවිධාකාරයේ අලාභයන්, වින්දිත කණ්ඩායම් හා දිවි ගලවා ගත් කණ්ඩායම් සඳහා පහත දක්වා ඇති පරිදි මූල්‍යමය වන්දි ලබා දීමට යෝජනා කෙරිණි.

අ) ආදරණීයයකු හා/ හෝ ගෘහමූලිකයකු අහිමිවීම සඳහා වන්දි ලබාදීම

ආ) අතුරුදහන් වූවන් සෙවීම සඳහා දැරීමට සිදු වූ ද්‍රව්‍යමය/ ද්‍රව්‍යමය නොවන වියදම් සඳහා වන්දි ලබා දීම

ඇ) ලිංගික හිංසනය හා අබාධිතබව ඇතුළු ශාරීරික හිංසනය හා පීඩාවන් සඳහා වන්දි ලබා දීම

ඈ) අභ්‍යන්තර හා බාහිර අවතැන්වූවන් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය යළි ලබා දීම ඇතුළුව වන්දි ලබා දීම

ඉ) දේපළ හා වත්කම් අහිමි වීම වෙනුවෙන් වන්දි ලබා දීම

ඊ) මනෝ සාමාජීය බලපෑම් හා මානසික කම්පනය වෙනුවෙන් වන්දි ලබා දීම

එ) සාම්ප්‍රදායික/ දේශීය ජීවන රටාව අහිමි වීම වෙනුවෙන් වන්දි ලබා දීම

හදිසි අවශ්‍යතාවන් සඳහා අන්තර්කාලීන හානි පූර්ණයන් එනම් බලපෑමට ලක්විය හැකි මිය ගිය හෝ අතුරුදන් වූ අයගේ පවුල්වල සාමාජිකයන් සඳහා රැකියා හා ඔවුන්ගේ ළමුන්ට ශිෂ්‍යත්ව ලබා දීම සඳහා ද ඉල්ලීම් ඉදිරිපත් විය.

8. උත්සව හා අවකාශයන් වෙන් කිරීම මගින් අනුස්මරණය කිරීම, නිළ වශයෙන් පිළිගැනීම හා සමාව ඉල්ලා සිටීම ආදී වශයෙන් සංකේතාත්මක හානි පූරණයේ අවශ්‍යතාව අදහස් ඉදිරිපත් කිරීම් සැලකිය යුතු වාර ගණනක දී ඉස්මතු කෙරිණි.

9. සියළු මට්ටම්වල පුරවැසියන් ඇතුළත් වන ක්‍රියාවලියක් ලෙස අනුස්මරණයේ අවශ්‍යතාවය අදහස් ඉදිරිපත් කිරීම් ගණනාවක දී අවධාරණය කෙරිණි. අනුස්මරණය කිරීමේ වඩාත් ප්‍රචලිත ක්‍රමය වන ස්මාරක, වේදනාව පිළිබඳ වන විස්තර රාශියට ගරු කරමින් අපක්ෂපාතීව හා ඔවුන් ස්මරණය කිරීමට ඇති එකම සංකේතය ලෙස නොසැලකෙන පරිදි හෝ ඇතැම් කණ්ඩායම් යළිත් විපතට පත් වීමේ අවදානම වැළැක්වෙන අයුරින්, සංවේදී ලෙස නිර්මාණය කළ යුතු බව මෙම අදහස් ඉදිරිපත් කිරීම් මගින් ඉස්මතු කෙරිණි. ජනතාවට ඉගෙනගැනීමේ කටයුතු හා ආවර්ජනය කිරීම සඳහා ක්‍රියාකාරීව සහභාගි විය හැකි පුස්තකාල හා කෞතුකාගාර වැනි විකල්ප අවකාශයන් ද යෝජනා කෙරිණි. ස්මරණය කිරීම සඳහා වන අවකාශයන් යනු ස්මාරක හෝ ස්පර්ෂ කළ හැකි ඉදිකිරීම් ම විය යුතු නැති බවද අදහස් ඉදිරිපත් කිරීම් වලදී දැක්වීය. උදාහරණයක් ලෙස එක් අදහස් ඉදිරිපත් කිරීමක දී සඳහන් කරන ලද්දේ මුල්ලිවයික්කාල්හි කාන්තාවන් හට සිත් සනසවන හා නිසල අවකාශයන් ලෙස තුරු ලතාවන්, පක්ෂීන් හා දිය පහරවලින් යුතු ජීවමාන අනුස්මරණ අවකාශයන් අවශ්‍ය බවයි.

10. උතුරේ පවතින ස්මාරක පිළිබඳ සිංහල හා දමිළ ප්‍රජාවන්ගේ අදහස් අතර සැලකිය යුතු ප්‍රමාණයක ප්‍රතිවිරුද්ධතාවක් විය. මෙම ස්මාරක හමුදා භටයන්ගේ අභිමානය හා ජයග්‍රහනයේ සංකේත හා ස්මරණය කිරීමේ අවකාශ ලෙස සිංහල ජනතා අදහස්වලින් දැක්වුව ද දමිළ ජනතාවගේ හැඟීම වූයේ මෙම ස්මාරක ඉදි කර ඇත්තේ ඔවුන් ජන කොටසක් ලෙස පරාජයට පත් වීම මතක් කර දීමට බවයි. මෙම ස්මාරක පසු කර යාමේ දී ඒවා මගින් ප්‍රකාශ කෙරෙන ජයග්‍රහණය ලබා ගැනීම සඳහා අහිංසක ජීවිත ගණනාවක් අහිමි කර ගැනීමට සිදු වූ බව සිතෙන විට ඔවුන්ට දැනෙන වේදනාව ද ඔවුන් විසින් සඳහන් කරන ලදී.

11. මෙම ස්මාරක පිළිබඳ විවාදයට අමතරව, මිනිස් සංහාරයන් වැනි ජීවිත අහිමි වූ විශේෂ අවස්ථා මෙන්ම අතුරුදහන් වූවන් සංකේතවත් කිරීම ආදිය සඳහා නව ස්මාරක ඉදිකිරීම සඳහා ඉල්ලීම් ගණනාවක් ද රටේ සෑම ස්ථානයකින් ම ඉදිරිපත් කෙරිණි. දකුණේ කැරැල්ලේ දී දිවි අහිමි වූ සිවිල් වැසියන් සඳහා දියවන්නාවෙහි ඉදි කර තිබූ, පශ්චාත් යුද සමයේ දී විනාශ කරන ලද ස්මාරකය, නැවත ඉදි කිරීමේ අවශ්‍යතාවය ද එක් අදහස් ඉදිරිපත් කිරීමක දී සඳහන් කෙරිණි.

12. මෙහිදී ප්‍රසිද්ධියේ හා පෞද්ගලිකව ශෝක වීමේ අයිතිය ද ඉස්මතු කෙරිණි. විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල, එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ගේ සොහොන් විනාශ කිරීම හා එමගින් ඇති වූ සිත් තැවුල සහ මිය ගිය පුද්ගලයන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය නිරන්තරයෙන් ඉස්මතු කළ කරුණු විය. තර්ජන හා බිය ගැන්වීම් හේතුවෙන් බොහෝ පවුල්, විශේෂයෙන් එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ගේ පවුල් තුළ පෞද්ගලිකව හෝ ශෝක වීමට තමන්ට නිදහසක් නැතැයි යන හැඟීම විය. ආදරණීයයන් සඳහා ශෝක වීමේ අවස්ථාවක් ලෙස "මාවීරාර් දිනම්" (මිය ගිය එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් අනුස්මරණය කිරීම) අඛණ්ඩව කරගෙන යාමට අවස්ථාව සලසා දිය යුතුය යන අදහස උතුරින් මතු කෙරිණි. පවුල්වල සාමාජිකයන්, විශේෂයෙන් මව්වරුන්ට තම නිවසේ මිය ගිය එල්.ටී.ටී.ඊ. සාමාජිකුගේ ඡායා රූපයක් තබා ගැනීමට හැකි විය යුතු බව ද පැවසිණි. පවුලේ සාමාජිකයන්ට සොහොන් බිම් ප්‍රතිසංස්කරණය කර දීම හා පසුකාලීනව එම ස්ථානවල ඉදි කරන ලද සියළු ගොඩනැගිලි ඉවත් කිරීම ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය මගින් නිර්දේශ කෙරේ.

13. විවිධ ප්‍රජාවන් විසින් අහිමි වූ ජීවිත හා ඔවුන්ට එරෙහිව සිදු කෙරුණු වැරදි ක්‍රියාවන් අනුස්මරණය කිරීම සඳහා දින ගණනාවක් යෝජනා කෙරිණි.

14. වෙනත් යාන්ත්‍රණවලට ඇති සම්බන්ධතාවන් හේතුවෙන් බොහෝ දෙනා හානි පූර්ණය වෙනත් ක්‍රියාවලීන්ගෙන් වෙන් කර හඳුනා ගත්තේ නැත. හානි පූර්ණය කිරීම් වෙනත් ක්‍රියාවලීන්ගේ, විශේෂයෙන් සත්‍යය හා යුක්තියේ කොටසක් විය යුතු යැයි බොහෝ දෙනාගේ හැඟීම විය. කෙසේවුවද, පෞද්ගලික හා සාමූහික වශයෙන් ඉතිහාසයේ තොරතුරු ලේඛණගත කිරීම මගින් හානි පූර්ණය කිරීම සඳහා වන ඉල්ලීම්වල නිශ්චිත වූ සම්බන්ධතාවක් ඇති බව පෙනී යයි.

15. සත්‍යය සොයා ගැනීමේ/ ප්‍රකාශ කිරීමේ සහ සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාවේ අරමුණුවල අගය පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම් ගණනාවක් ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය වෙත ලැබිණි. අරමුණු ගණනාවක් හඳුනා ගත් අතර අදහස් ඉදිරිපත් කිරීම් බහුතරයක් මගින් සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාව පහත දැක්වෙන අරමුණු ද ළඟා කර ගත යුතු බව දැක්වීය.

අ) සත්‍යය ස්ථාපනය කිරීම

ආ) ගැටුමෙහි මූලය  නිශ්චය කර ගැනීම

ඇ) අපරාධකරුවන් වග වීමට ලක් කිරීම

ඈ) සම අයිතිවාසිකම් ලබා දීම

ඉ) ඉතිහාසය පිළිබඳ බහුවිධ ආඛ්‍යානයන් ගොඩනැගීම

ඊ) නැවත සිදු නොවීම සඳහා සහ ප්‍රචණ්ඩත්වය හා අපයෝජනයන් සඳහා පිළියම් සෙවීමට පීඩාවට පත් වූවන්ට හැකි වන පරිදි නිර්දේශ ඉදිරිපත් කිරීම

පෙර පැවති කොමිෂන් සභාවල අසාර්ථකත්වය හා මීට පෙර මේ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියා මාර්ගයක් නොගැනීම හේතුවෙන් සත්‍යය සෙවීමේ ප්‍රවේශය පෙර ගන්නා ලද ප්‍රයත්නයන්ගෙන් මූලික වශයෙන් වෙනස් විය යුතු බව අදහස් ඉදිරිපත් කිරීම්වලදී අවධාරණය කෙරිණි. එබැවින් සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාව මගින් දැනට පවතින කටයුතු ඉදිරියට ගෙන යෑම, පෙර පැවති කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා ස්ථිරසාර ක්‍රියා මාර්ග මගින් ඒවා ඉදිරියට කරගෙන යාම සිදු කළ යුතු බවට ඔවුහු අවධාරණය කළහ.

16. අදහස් ඉදිරිපත් කිරීම් බොහෝමක් විසින් සියල්ල ඇතුළත් ප්‍රවේශයකට සහාය දක්වන ලද අතර බලපෑමට ලක් වූ පුද්ගලයන්, කණ්ඩායම් හා ප්‍රජාවන් ඇතුළත් වන පුළුල් කාල රාමුවක් නිර්දේශ කරන ලදී. අදහස් ඉදිරිපත් කිරීම් මගින් ආයුධ සන්නද්ධ ගැටුම් හා ප්‍රචණ්ඩකාරී කාල සීමාවන් ලෙස එල්.ටී.ටී.ඊ. හා ශ්‍රී ලංකා රජය අතර යුද්ධය (1983-2009), ජනතා විමුක්ති පෙරමුණ හා ශ්‍රී ලංකා රජය අතර තරුණ කැරැල්ල හා දේශපාලනික ප්‍රචණ්ඩත්වය (1971 හා 1987-89), දමිළ විරෝධී සංහාරය (1983), සුළුතර ආගම්වලට එරෙහි ප්‍රචණ්ඩත්වය හා වෙනස් කොට සැලකීම (මූලික වශයෙන් පශ්චාත් යුද අවධිය) සහ රජය මැදිහත් වූ වෙනත් ප්‍රචණ්ඩකාරී අවස්ථා සඳහන් කරන ලදී.

17. බොහෝ අදහස් ඉදිරිපත් කිරීම් මගින් යෝජිත කොමිෂන් සභාවේ බලය පැහැදිලිව දැක්වීම හා පෙර පැවති පරීක්ෂණ සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාවලින් වෙනස් කර දැක්වීමේ අවශ්‍යතාව මෙන් ම සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාව වෙත පූර්ණ විමර්ෂණාත්මක භූමිකාවක් ඇති බව ද පෙන්වා දෙන ලදී. පීඩාවට ලක් වූවන්ගේ අදහස් විමසා පොදු සමාව දීමේ බලය සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාවට තිබිය යුතු බව සහ යුක්තිය පසිඳලීමේ ආයතනයක් වෙත සිද්ධීන් යොමු කිරීමේ බලය ද තිබිය යුතු බව ඇතැම් අදහස් ඉදිරිපත් කිරීම්වලදී පෙන්වා දුණි. ඇතැමුන් පොදු සමාව සත්‍යය හෙළි කිරීම සඳහා වන පෙළඹවීමක් ලෙස දැක්වූ අතර විධාන දීමේ වගකීම දරණ පහළ මට්ටම්වලදී පොදු සමාව දීම පිළිබඳ සානුකම්පිත අදහසක් ඇති පිරිසක් ද වූහ. අනෙක් පිරිස කිසිඳු හේතුවක් යටතේ පොදු සමාව දීමට තදින් ම විරුද්ධ විය. එමෙන් ම සමස්ථයක් ලෙස විධාන දීමේ වගකීම සහිත මට්ටමේ, එනම් නියෝග ලබා දෙන අය විසින් වග වීම නිශ්චිතවම අවබෝධ කරගත යුතු අතර මෙහිදී පොදු සමාවට ඉඩක් නොමැත යන පණිවිඩය ලබා දුණි.

18. අනෙකුත් අදහස් ඉදිරිපත් කිරීම් මගින් කොමිෂන් සභාවේ නැවත සිදු නොවීම යන කරුණ පිළිබඳ අවධානය යොමු කළ අතර වෙනස්ව සැලකීමේ රාජ්‍ය ප්‍රතිපත්ති වැනි මීට පෙර සිදු වූ උල්ලංඝණයන් හඳුනාගැනීම, අවධාරණය කිරීම හා පිළියම් සෙවීම හා ඒවා නිවැරදි කිරීමේ බලය සහිත විය යුතු බවට නිර්දේශ කරන ලදී. සංහිඳියාව සඳහා වන වෙනත් යාන්ත්‍රණයන්, විශේෂයෙන් අධිකරණ යාන්ත්‍රණය හා හානි පූර්ණය සඳහා වන කාර්යාලය සහ සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාව අතර ඇති සම්බන්ධතාවන් පොදුවේ පිළිගැණුනි. යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාව විශේෂ අධිකරණය අනුපූරණය නොකළ යුතු අතර සත්‍යය හා යුක්තියට විරුද්ධව සංහිඳියාව සහ නැවත සිදු නොවීම කෙරෙහි පමණක් අවධානය යොමු කළ යුතුයැයි එක් ඉදිරිපත් කිරීමක් සඳහන් කලේය

19. තොරතුරු බෙදාහැරීමේ ක්‍රියාවලියට මාධ්‍ය වේදීන් හා කලාකරුවන් සහභාගිකර ගැනීම, කොමිෂන් සභාව හරහා තොරතුරු ලබා දීම සහ එහි අවසාන වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් ම ජනතාවට පහසුවෙන් ලබා ගැනීමට අවකාශ සලසා දීමේ වැදගත්කම පෙන්වා දෙමින් විශේෂයෙන් සත්‍යය, යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාවේ දැනුවත් කිරීම, ජනතාවට සමීප වීම හා සන්නිවේදන කටයුතු පිළිබඳ අවධාරණය කෙරිණි. නැවත සිදු නොවීම සඳහාත් සංහිඳියාව කෙරෙහි අනුබල දීමටත් පීඩාවට පත් වූවන්ට සහාය දීමේ ප්‍රායෝගික අවශ්‍යතා සඳහාත් සම්පූර්ණ ඓතිහාසික ලියවිල්ලක් ලෙස මූලික වශයෙන් අනාගතය සඳහා තොරතුරු ලේඛණගත කිරීමේ වැදගත්කම ද අදහස් ඉදිරිපත් කිරීම්වලදී හඳුනා ගැණිනි. සත්‍යය , යුක්තිය, සංහිඳියාව හා නැවත සිදු නොවීම සඳහා වන කොමිෂන් සභාවේ සොයාගැනීම් ජාතික අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි ඇතුළත් විය යුතු බවට ප්‍රවිචාරණ කාර්ය සාධක බලකාය නිර්දේශ කරයි.

20. අදහස් ඉදිරිපත් කිරීම් මගින් බලපෑමට ලක් වූවන් අතරින් තෝරා ගත් කණ්ඩායම් සඳහා ප්‍රසිද්ධියේ කරුණු විභාග කිරීමේ අවස්ථාව ද අනෙක් පිරිසට පුද්ගලිකව සාක්ෂි ලබා දීමේ අවස්ථාව ද සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. පැමිණිලි භාර ගැනීම හා දඩුවම් පැනවීම සහ වාර්තා